බන්ධනාගාර කොමසාරිස් ජනරාල් චක්‍රලේඛ අංක : 44/2013

මගේ අංකය: කේ 05/විවිධ/2012
බන්ධනාගාර මූලස්ථානය.
කොළඹ 09
2013-12- 25 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් හා
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>එළිමහන් සිරකඳවුරු වලට හා වැඩ කඳවුරු වලට සිරකරුවන් මාරු කිරීම</u>

අංක 35/95 හා 1995-09-11 දිනැති චක්‍ර ලේඛය , 06/02 හා 2002/01/21 වන දිනැති චක්‍රලේඛය හා 2012/28 හා 2012.11.01 වන දින චක්‍රලේඛ එසේම ක්‍රියාත්මක වන අතර ඊට අමතරව බන්ධනාගාරය තුල සයමසක පමණ කාලයක් ගතකල නිදහස් වීමට අවුරුදු 05 ක (පහක් ) දණ්ඩන කාළයක් ඇති සිරකරුවන් එළිමහන් සිර කඳවුරු හා වැඩ කඳවුරු වෙත මාරුකර යැවීමට සහ එම කඳවුරු වල රඳවා තබා ගැනිම සඳහා මෙයින් අනුමැතිය ලබා දෙන අතර , පහත සඳහන් කොන්දේසි අනුගමනය කර සිරකරුවන් මාරු කල යුතුය.

01. සිර කරුවන් තෝරා ගැනිම සුභසාධක නිළධාරි විසින් සිදු කල යුතුය.
02. සුබ සාධක නිළධාරි විසින් තෝරාගත් සිරකරුවන් අධිකාරිගේ අනුමැතියෙන් පසු මාරු කිරීම කල යුතුය.
03. තෝරා ගන්නා ලද සිරකරුවන් පළමු .දෙවන හා තෙවන වර බන්ධනාගාර ගතවූ වයස 22 ට වැඩි විසදීමට නඩු නොමැති පොලිස් පරික්ෂණ නොමැති සිරකරුවන් විය යුතුය.
04. කඳවුරු සේවයට මාරු කිරීමට පෙර සිරකරුවන් මනා සෞඛ්‍ය තත්වයෙන් සිටින බවට වෛද්‍ය වරයා වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගත යුතුය .

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්